# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2013**
**(නව නිර්දේශය)**
**2016 අගෝස්තු - ඔක්තෝබර්**

**මානවශාස්ත්‍ර පීඨය**

**නාට්‍ය හා රංග කලාව - DMAT - E 3025**

**නාට්‍ය නිර්මාණය හා විචාරය**

**ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.**

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි.** **කාලය : පැය 03 යි.**

---

01. නළුවරණය (Casting) හෙවත් විවිධ චරිතාංග සඳහා නළු නිළියන් තෝරා ගැනීම අධ්‍යක්ෂකවරයා මුහුණ දෙන සංකීර්ණ අභියෝගයකි. විමසන්න.

02. සැබෑ නාට්‍යයක් කිසිවිටකත් එය අයත් වූ සමාජ පරිසරය හා පසුබිම අමතක නොකරයි. මෙම අදහස ඇසුරින් අධ්‍යක්ෂකවරයාගේ අර්ථකථනය පිළිබඳ විචාර ලිපියක් ලියන්න.

03. පෙරදිග හා අපරදිග රංග කලාවේ 'නාට්‍ය රචනය' පිළිබඳ දක්වා ඇති මතවාද පිළිබඳ විවරණයක් කරන්න.

04. අනුෂාංගික අංග පිළිබඳ කෙටියෙන් විස්තර කොට ඒවා රංගයක ප්‍රේක්ෂාව හා ගැඹුරු අර්ථකතනයන්ට කෙතෙක්දුරට බලපාන්නේදැයි විමසන්න.

05. රංගාලෝකය, පසුතල රචනය, ඇඳුම් නිර්මාණය, සහ **වර්ණ** අතර රංග කලාවේ දී දක්නට ලැබෙන සහසම්බන්දතාවය නිදසුන් සහිතව ඉදිරිපත් කරන්න.

06. නාට්‍යමය සංගීතය සහ රංග වින්‍යාසය විස්තර කොට එම අංග ගැඹුරු හා නිර්මාණාත්මක ලෙස යොදා ගැනීම පිළිබඳ නිදසුන් සහිත විග්‍රහයක් කරන්න.

07. නළුවෙකුට වඩා අභියෝගාත්මක වන්නේ චිත්‍රපටයක රඟපෑම ද? නාට්‍යයක රඟපෑම ද? ඔබේ පිළිතුර සහේතුක කරුණු ඉදිරිපත් කරමින් තහවුරු කරන්න.

08. කලා කෘතියක් පරිශීලනය කිරීමේ දී රසිකයා තුළ ජනිතවන සෞන්දර්යාත්මක ආකල්ප සහ ඊට පරිබාහිර වෙනත් ආකල්ප පිළිබඳ විග්‍රහයක් කරන්න.

09. ලස්සන නාට්‍යයක් සහ ගැඹුරු නාට්‍යයක් අතර වෙනස විචාර කලාවේ මූලධර්ම ඇසුරින් නිදසුන් සහිතව ඉදිරිපත් කරන්න.

10. ඔබ මෑතකදී නැරඹූ **නාට්‍ය දෙකක්** තෝරා ගෙන එහි අර්ථකථනය සහ අනුෂාංගික අංග භාවිතයේ තිබූ වෙස්කම් පිළිබඳ පුවත් පතක පළකිරීමට සුදුසු **විචාරයක්** ලියන්න.

*******************